**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ශේෂය ලෙස 2021 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබූ එහෙත් ඉදි නොකළ කාබනික පොහොර ඇසුරුම් කිරීම සහ ගබඩා අංගනය යනුවෙන් දක්වන රු.42,170,000 ශේෂයක් දෝෂසහගතව ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු. 18,735,571 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2020 වර්ෂයේ සේවය හැරගිය පුද්ගලයකුගේ රු. 196,344 ක ණය ශේෂයක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ කුණ්ඩසාලේ අලුත්වත්ත ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ නියමු ව්‍යාපෘතිය සඳහා කවෂිමා යන්ත්‍රයේ උපාංග සවිකිරීම වෙනුවෙන් වැයකළ රු. 71,589,329 ක් හා වෙනත් වැඩිදියුණු කිරීම සඳහා වැය කළ රු. 12,000,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2010 වර්ෂයේ අනුබෙදුම් කර වෙන්දේසියේ විකුණනලද ඉඩම්වලින් සභාවට පවරා තිබුණු රු. 1,033,912 ක උයන්වත්ත ඉඩම හා රු.1,777,845 ක මොරගහපිටිය ඉඩම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඊ) | ඉකුත් වර්ෂයේ ගිණුම්වලින් ඉවත්කර තිබුණු වරාපිටිය මහජන පුස්තකාලය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම වූ රු. 650,000 ක් නැවත ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සංවර්ධන යෝජනාවලින් ඉවත් කර තිබුණු අමුණුගම තේවරවත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම රු.1,300,000 ක් ණය හිමියන් යටතේ දෝෂසහගතව ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (උ) | ඉකුත් වර්ෂයේ සභා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීමට වැය කළ රු. 1,900,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති 06 ක කර්මාන්ත ලිපිගොනු අනුව වියදම රු. 5,422,767 ක් වුවද , ඇස්තමේන්තු අගය වූ රු.7,225,000 ක් ණය හිමි ලෙස ගිණුම්ගත කිරීමෙන් රු. 1,802,233 ක් ණය හිමියන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළ සභික කාමර හා සභා ශාලාව සැකසීමේ වියදම වූ රු. 3,443,171 ක් ප්‍රාග්ධනිත නොකර පුනරාවර්තන වැය යටතේ ගිණුගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඒ) | 2015 -2017 වර්ෂයන්ට අදාළව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් දෙකකින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු.14,753,555 ක ආදායම ගිණුම්ගත කර නොතිබූ අතර 2018 සිට සමාලෝචිත වර්ෂය දක්වා අදාළ බලපත්‍ර ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයන් 10 ක ශේෂයන් හා වගකීම් විෂයයන් 01 කට අදාළ ශේෂයන් ඊට අදාළ උපලේඛනවල, ලේඛනවල ශේෂයන් සමඟ සැසඳීමේ දී රු. 70,302,688 ක වෙනසක් පැවතුණි. | වෙනස නිවැරදිව හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ප්‍රාග්ධන යෙදුමට අදායමින් හා ආධාර මඟින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.1,415,166,045 ක් වුවද ස්ථාවර වත්කම් ශේෂය රු.1,416,501,094 ක් වූයෙන් රු.1,335,049 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

**1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂය අවසාන දිනට සභාවේ පෙර ගෙවුම් ශේෂය වූ රු.18,145,527 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස රු. 18,428,135 ක් සාවද්‍ය ලෙස හරස් සටහන් මඟින් බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.58,065,295 ක වත්කම් ශේෂ 09 ක හා වගකීම් ශේෂ 03 කට අදාළ භෞතික පැවැත්ම, ලිපිගොනු, ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | තොරතුරු සොයා බලා ලේඛනගත කර නිවැරදිව උපලේඛන පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන බව. | ගිණුම් ශේෂයන්ට අදාළ ලේඛන ලිපිගොනු හා උපලේඛන පවත්වාගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | හෝටල් 02 කින් 2015 සිට 2017 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ බලපත්‍ර ගාස්තුව රු. 14,753,555 ක් අයකර ගෙන නොතිබුණි. | නඩු පවරා ඉදිරියේදී අයකරගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ආදායම් අයකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත | | | |
| | ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | සභා බල ප්‍රදේශයේ පිහිටි ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානවලින් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ත්‍රී රෝද රථ ගාස්තු රු. 3,686,433 ක් අයකර ගෙන නොතිබුණි. | ගාස්තු අයකිරීමට කටයුතු කරන බව. | ආදායම් අයකර ලත යුතුය. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 (3) හා (4) | සභාව සතු කැබ් රථය 2022 ජනවාරි 20 දින හදිසි ගිනි ගැනීමකට ලක්වී තිබූ අතර ඒ සම්බන්ධව පරීක්ෂණ අවසන් කර නොතිබුණි. | රස පරීක්ෂක වාර්තාවක් ලබාගත යුතු බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි394 | කාලය හඳුනාගත නොහැකි නිකුත් කරන ලද පසුව අගරු වූ රු. 156,041 ක චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරිවර්ෂයේ නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.74,705,125 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 181,233,144 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2023 බිල් කළ ආදායම රු. | 2023 රැස්කළ ආදායම රු. | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2022 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2022 බිල් කළ ආදායම රු. | 2022 රැස්කළ ආදායම රු. | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 64,118,347 | 42,692,287 | 34,835,347 | 57,623,127 | 42,815,634 | 33,079,249 | 16,686,937 | 49,766,187 |
| (ii) | කුලී | 20,018,920 | 17,756,548 | 19,186,050 | 2,810,475 | 8,781,620 | 10,039,619 | 14,279,596 | 4,239,977 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 18,574,146 | 7,100,000 | 7,100,000 | 15,321,640 | 5,985,000 | 5,983,999 | 5,983,999 | 15,321,640 |
| (iv) | වෙනත් ආදායම් | 174,613,776 | 174,613,776 | 86,463,058 | 331,137,124 | 213,435,930 | 213,435,980 | 29,550,426 | 242,986,406 |
| | | 277,325,189 | 242,162,611 | 147,584,455 | 406,892,366 | 271,018,184 | 262,538,847 | 66,500,958 | 312,314,210 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.55,330,880 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් හිඟය රු.50,000 – 100,000 ත් අතර දේපල 12 කින් එකතුව රු.795,604 ක්ද, රු.100,000ට වඩා වැඩි දේපල 07 කින් රු. 18,600,204 ක් ද එතුල පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.17,007,003 ක්ද රජයේ දේපල 830කින් රු.528,565 ක් විය. | දේපල තහනම් කර අයකරගන්නා බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කඩ කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,810,475 ක කඩ කාමර කුලී හිඟ ශේෂය අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර එතුළ මුද්‍රා තැබූ කඩකාමර 03 කින් රු. 457,390 ක් අයවිය යුතුව පැවතුණි. | කඩ හිමියන් දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ii) | 2014 වර්ෂයේ දී ටෙන්ඩර් කර පවරන ලද දිගන බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 05 කින් රු.2,639,500 ක ටෙන්ඩර් මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අයකරගෙන නොතිබුණි. | නීතිමය පියවර ගෙන ඇති බව. | -එම- |

(ඇ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.6,938,663 ක් හා මුද්දර ගාස්තු රු.157,532,539 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඉටු කිරීමට සැලසුම් කර තිබුණු රු.63,000,000 ක සංවර්ධන ව්‍යාපෘති 114 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බව. | සැලසුම්කළ සංවර්ධන ව්‍යාපෘති ඉටු කළ යුතුය. |
| (ආ) | කුණ්සාලේ ප්‍රාදේශීය සභාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධන දිගන අලුත්වත්ත කසළ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා 2021 වර්ෂයේ රු. මිලියන 90 ක් ප්‍රධාන අමාත්‍යාංශය හරහා පළාත් පාලන කොමසාරිස් වෙත ලබා දී තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ. | පාතදුම්බර ප්‍රාදේශීය සභාව සම්බන්ධ නොවීම හේතුවූ බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (i) | කවිෂිමා යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු සඳහා ප්‍රතිපාදන වැඩිපුර යෙදවීමෙන් ගබඩා අංගනය ඉදිකිරීමට වෙන්කර තිබූ රු.මිලියන 42.17 ක මුදලින් රු. මිලියන 29.38 ක් ඒ සඳහා යෙදවීමට සිදුවූ බැවින් ගබඩා අංගනය ඉදිකිරීම අතහැර දමා තිබුණි. ඉතිරි වූ රු. මිලියන 12 ක මුදල කසළ අංගනයේ වෙනත් කාර්යයන් සඳහා අවිධිමත්ව යොදවා තිබුණි. | අනුමත වූ ව්‍යාපෘති දෙකකට යෙදවූ බව | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ii) | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට හා කාබනික පොහොර ක්‍රියාවලිය නිසිපිරිදි ඉටුකිරීමට අදාළ එකතු කරන ලද දිරන කසළ, අඹරන ලද කසළ හා නිපදවන පොහොර වැස්සට නොතෙමී ගබඩා කිරීම, අඹරන ලද කසළ නියමිත ප්‍රමිතියෙන් | ඉදිරියේදී නිවැරදි සැලැස්මකින් කටයුතු කිරීමට පිළියම් යොදන බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතුව දිරාපත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීම හා පොහොර නිසි ප්‍රමිතියකින් යුතුව ගබඩා කිරීම යනාදී අත්‍යවශ්‍ය කරුණු සඳහා ඉදිකිරීමට යෝජිත වූ ගබඩා අංගන ගොඩනැගිල්ල නිසිපරිදි සැලසුම් නොකිරීම හා නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය මත සැලසුම් කළ පරිදි ඉදිකිරීමට නොහැකිවී තිබුණි. | | |
| (iii) | කාබනික පොහොර අංගනය සඳහා කසළවල අධික තෙතමනය ඉවත් කිරීමට 2021 වර්ෂයේ රු. 10,287,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු යන්ත්‍රය මිලදී ගත් දින සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. | විදුලිය සවි කර ගැනීමේ ප්‍රමාදය හේතුවූ බව. | නිසි පරීක්ෂාවකින් යුතුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (iv) | අලුත්වත්ත ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතියේ පොලිතින් හා ප්ලාස්ටික් මඟින් ඉන්ධනයක් නිෂ්පාදනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2021 වර්ෂයේ ජනවාරි 28 දින සභාව පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ වී නොතිබුණු අතර සභාව ව්‍යාපෘති භූමිය සකස් කිරීම සඳහා 2021 සිට 2022 දක්වා රු.29,782,203 ක වියදමක් දරා තිබුණි. එහෙත් මෙම යන්ත්‍රය සවිකිරීමට ගිවිසුම්ගතව පවරා තිබුණු කොන්ත්‍රාත්කරු එය සවි නොකිරීම හේතුවෙන් ඒ වෙනුවෙන් සභාව දැරූ වියදම් නිශ්ඵල වී තිබුණි. මේ සම්බන්ධව කොන්ත්‍රාත්කාර ආයතනය සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිෂ්ඵල වියදමක් නොවූ බව. | අරමුණට අදාළ කාර්යයන් ඉටු කළ යුතු අතර අධීක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කළ යුතු අතර වැඩ ඉටු නොකිරීම සම්බන්ධව කොන්ත්‍රාත් ආයතනය සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.257,718,123 ක වූ ණය හිමි ශේෂයක් හා රු. 105,569,537ක ණයගැති ශේෂයක් නිරවුල් කිරීමට හා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයගැති ශේෂ අයකරගැනීමටත් ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණයගැති ශේෂ අයකරගැනීමටත් ණය හිමි ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පොහොර තොගය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**3.3 නිෂ්කාශර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. 4,500,000 ක් කැබ් රථයක් 2012 වර්ෂයේ සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියාව සඳහා විශාල වියදමක් දැරිය යුතු බැවින් ඉවත් කර ඇති බව. | අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිගන බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 12 ක් වර්ෂ ගණනාවක සිට වසා දමා තිබුණු අතර වසා දැමූ කඩ සම්බන්ධව සමාලෝචිත වර්ෂය තුළ විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | අදාළ කඩකාමර පවරා දීමට හෝ නිසි ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත් සකසා ඇති දේපල 34 ක් හා සභාව භුක්ති විඳින ඉඩම් 272 ක් පවරාගෙන නොතිබුණි. | ලිපි මඟින් දැනුවත් කර ඇති බව | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගන 12 ක් වැට මායිම් සකස් කර ආරක්ෂාව තහවුරු කර නොතිබූ අතර එම භූමිවල කැලෑවැවී ගොඩනැගිලි නඩත්තු කිරීමකින් තොරව විනාශ වීමට ඉඩහැර තිබුණි. | වැටවල් ඉදිකිරීමට යෝජනා කර ඇති බව. | ඉඩම්වල ආරක්ෂාව තහවුරු කර අරමුණුගත කාර්යයකට යොදවා ගත යුතුය. |

**3.5 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට බැකු ගිණුම්වල පැවති රු. 209,433,521 ක පුනරාවර්තන ආදායම ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගැනීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අතිරික්ත මුදල් ආයෝජනය කර ඇති බව. | අතිරික්ත මුදල් සංවර්ධන කටයුතු සඳහා යොදවා ගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී තනතුරු 10 ක පුරප්පාඩු 21 ක් ද එක් තනතුරක අතිරික්තතා 20 ක් ද පැවතුණි. | රජයේ ප්‍රතිපත්ති මත බඳවාගැනීම් අත්හිටුවීම හේතුවෙන් පුරප්පාඩු ඇති වී ඇති බවත් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම හේතුවෙන් අතිරික්ත වූ බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) | 2021 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ මිය ගිය, වැටුප් රහිත නිවාඩු ලබා ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් හා සේවකයින් 03 දෙනෙකුගෙන් රු.572,857 ක් අයකර නොතිබුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ළඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉලක්ක හා දර්ශක යම්තාක් දුරට හඳුනාගෙන ඇති බව. | ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |